සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

දෙවන වාර පරීක්ෂණය 2017
மூன்றாம் தவணைப் பரீட்சை 2017
**Second Term Test 2017**

11 ශ්‍රේණිය
தரம்11
**Grade 11**

ඉතිහාසය I
History **I**

පැය 1 යි
one hours

ඉතිහාසය I

සැලකිය යුතුයි.

- ★ සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 80ක් හිමිවේ.
- ★ අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (i), (ii), (iii), (iv) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ★ ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

(01) ලංකා ඉතිහාසය පිළිබඳ ව හැදෑරීමට ඇති පැරණිතම දේශීය සාහිත්‍ය මූලාශ්‍රය වන්නේ කුමක්ද?

(i) ථූප වංශය (ii) දාඨාවංශය
(iii) දීප වංශය (iv) මහා වංශය

(02) පහත දී ඇති ප්‍රකාශ කියවා දි ඇති උපදේශවලට අනුව පිළිතුර සපයන්න.

A - මහා විහාරයේ වැඩ විසූ මහනාම හිමි විසින් රචනා කරන ලදී.
B - ලංකා ඉතිහාසයේ මහසෙන් රජු දක්වා පමණක් සඳහන්ය.
C - දළදා වහන්සේ පිළිබඳ ඉතිහාසයේ දැක්වීම.

ඉහත කරුණුවලට අදාළ ග්‍රන්ථ අනුපිළිවෙලට සඳහන් පිළිතුර වන්නේ,

(i) දීපවංශය, දාඨා වංශය , මහා වංශය (ii) දාඨා වංසය, දීපවංශය , බෝධි වංශය
(iii) මහා වංශය, දීප වංසය, දාඨා වංසය (iv) බෝධි වංසය, දාඨාවංසය, දීප වංශය

(03) ''ඉන්ඩිකා'' නැමැති විදේශ සාහිත්‍ය මූලාශ්‍රය රචනා කරන ලද්දේ,

(i) කොස්මස් (ii) ප්‍රකෝපියස් (iii) මෙගස්තිනීස් (iv) අබුසයිද්

(04) ක්‍රි.ව.9 සියවසේදී ''රතු කැට දිවයින'' ලෙස හැඳින් වූ අරාබි ජාතික ඉතිහාසඥයා,

(i) අබුසයිද් (ii) සුලෙයිමාන් (iii) ඉබන් බතූතා (iv) අල් බල්ශූරි

(05) මහාවංශයට ලියන ලද ටීකාව ලෙස සැලකෙනුයේ මින් කවරක්ද?

(i) විනයට්ඨ කථාව (ii) වංසත්ථප්පකාසිනිය (iii) ජාතකට්ඨ කථාව (iv) උත්තර විහාරඅට්ඨ කථාව

(06) ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමේ දී කාසි පිළිබඳ අධ්‍යනය හඳුන්වන්නේ,

(i) වාස්තු විද්‍යාව නමිනි. (ii) මානව විද්‍යාව නමිනි.
(iii) ආර්ථික විද්‍යාව නමිනි. (iv) නාණක විද්‍යාව නමිනි.

(07) ප්‍රාග් ඓතිහාසික මානවයා ඇටසැකිලි නමා වටකුරු කොට වළලා ඇති ස්ථානය වන්නේ,

(i) පාහියන්ගල (ii) බටදොඹලෙන

(iii) මිනිහාගල් කන්ද (iv) පොතාන.

(08) ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වු වෙරළාශ්‍රිත එළිමහන් කඳවුරක් වන්නේ,

(i) පාහියන්ගල (ii) හෝර්ටන්තැන්න.

(iii) බුන්දල (iv) සීගිරිය පොතාන

(09) මුල් යකඩ යුගය යන අන්වර්ථ නාමයෙන් හඳුන්වා ඇත්තේ කුමක්ද?

(i) ප්‍රාග් ඓතිහාසික යුගය (ii) පූර්ව ඓතිහාසික යුගය.

(iii) මුල් ඓතිහාසික යුගය (iv) ඓතිහාසික යුගය.

(10) ක්‍රි.පූ. 1129 දී පමණ ඉදිකරන ලද නිවාසයක අත්තිවාරමක් හමුවන ස්ථානය වන්නේ,

(i) බෙරගල (ii) සමනල වැව (iii) උඩරංචාමඩම (iv) ගල්පාය

(11) අතීතයේ ''කසීකාරගාම'' නමින් හැඳින්වූයේ,

(i) ගොවිගම් (ii) ගොපලුගම් (iii) ධීවරගම් (iv) වෙළඳගම්.

(12) සෙල්ලිපිවල නගරයේ වාස්තු ශිල්පියා හැඳින් වු නම වන්නේ,

(i) පරුමුක (ii) ගමික (iii) පුරකමත (iv) අන්තේවාසික

(13) අතීත වැව් පද්ධතියක් හඳුන්වා ඇති නමක් වන්නේ,

(i) වැව් ඉහත්තාව (ii) වැව් ප්‍රපතනය

(iii) වපි ගමික (iv) වාරික

(14) අතීතයේ ප්‍රභූන් භාවිතා කරන ලද මාලයක් හමුවන සුසාන භූමිය වන්නේ,

(i) උඩරංචාමඩම (ii) නිකවලමුල්ල.

(iii) ඉබ්බන්කටුව (iv) හල්දුම්මුල්ල.

(15) ශ්‍රී ලංකාවේ වර්ධනය වු රාජ්‍යත්ව සංකල්පය තුළ දේවත්වයෙන් පිදුම් ලැබූ රජතුමා,

(i) මහා පරාක්‍රමබාහු රජු (ii) පළමුවන කාශ්‍යප රජු

(iii) මහසෙන් රජු (iv) වසභ රජු

(16) ක්‍රි.ව. 4 වන සියවසෙහි මෙරට පැවති ප්‍රාදේශීය පරිපාලන මණ්ඩල හඳුන්වා ඇත්තේ,

(i) වදාල (ii) සභාව (iii) එක්තැන්සමිය (iv) දසගම් ඇත්තන්

(17) පොළොන්නරුවේ තිබූ දළදා මාලිගයේ ආරක්ෂාව සඳහා වේලයික්කාර හමුදා පත්කල පොළොන්නරු පාලකයා වන්නේ,

(i) පළමුවන පරාක්‍රමබාහු රජු (ii) පළමු විජයබාහු රජු

(iii) දෙවන ගජබාහු රජු (iv) හතරවන නිශ්ශංක රජු

(18) වෙළඳපාලක පාලනය පිළිබඳ iv වන උදය රජු විසින් කරවන ලද සෙල්ලිපිය වන්නේ,

(i) මිහින්තලා පුවරු ලිපිය (ii) බදුලු ටැම් ලිපිය

(iii) කෝණ්ඩවට්ටවාන් ලිපිය (iv) තෝණිගල සෙල්ලිපිය

(19) ''සමීපයේ වාසයකරන්නා'' යන්න සෙල්ලිපිවල දක්වා ඇත්තේ,

(i) ථෙර (ii) අන්තේවාසික (iii) සදිවිහරිය (iv) භාණක

(20) අතීත වැවක සොරොව්වෙන් ජලය ක්‍රමානුකූලව මුදාහැරීම සඳහා ඉදිකර තිබූ තාක්ෂණික මෙවලම වූයේ,

(i) දිය කැට පහන (ii) බිසෝකොටුව

(iii) මඩ සොරොව්ව. (iv) පිටවාන

(21) ලංකා ඉතිහාසයේ සත්ත්ව ඝාතනය වළක්වාලමින් ''මාඝාත නීතිය'' ප්‍රථම වරට පනවන ලද රජතුමා වන්නේ,

(i) අමණ්ඩගාමිණි අභය රජුය. (ii) දුට්ඨගාමිණි රජුය.

(iii) වට්ටගාමිණි අභය රජුය. (iv) භාතිකාභය රජුය.

(22) අතීතයේ දී ''කලඳ'' වශයෙන් හැඳින්වූයේ කුමක් සඳහා භාවිතා කළ මිනුම් ඒකකයක්ද?

(i) දුර මැනීමේ (ii) කාලය මැනීමේ.

(iii) දියර මැනීමේ (iv) බර මැනිමේ.

★ පහත සඳහන් වගුවේ A සිට J දක්වා තොරතුරු ඇසුරෙන් 23 හා 24 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| වර්ෂය | බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරු | ස්වදේශික නායකයන් |
|---|---|---|
| A 1803 | D ටොරින්ටන් සාමි | G ගොංගාලේගොඩ බණ්ඩා |
| B 1818 | E ෆ්‍රෙඩ්රික් නෝර්ත් | H කැප්පෙටිපොළ |
| C 1848 | F රොබට් බ්‍රවුන්රිග් | J ශ්‍රී වික්‍රම රාජසිංහ රජ |

(23) මැක්ඩෝවල් යටතේ උඩරට ආක්‍රමණය හා සම්බන්ධ තොරතුරු ඇතුළත් පිළිතුර කුමක්ද?

(i) AES (ii) AFG (iii) BFH (iv) CDI

(24) බ්‍රිතාන්‍යන්ගේ පාලනයට විරුද්ධව මෙහෙය වූ ප්‍රථම නිදහස් සටන සම්බන්ධ තොරතුරු ඇතුළත් ප්‍රකාශය

(i) ADG (ii) BES (iii) BFH (iv) CFJ

(25) දේශගවේෂණ සඳහා අනුග්‍රහය දුන් පුද්ගලයන් I තීරුවේත් ඔවුන්ගේ රටවල් II තීරුවේත් දැක්වේ.

| I තීරුව | II තීරුව |
|---|---|
| (i) හෙන්රි හඩ්සන් | (A) මහා බ්‍රිතාන්‍ය |
| (ii) පර්ඩිනන්ඩ් රජු හා ඉසබෙලා බිසව | (B) ස්පාඤ්ඤය |
| (iii) පළමුවන එළිසෙබෙත් රැජින | (C) ප්‍රංශය |
| (iv) නාවික හෙන්රි | (D) පෘතුගාලය |
| | (E) ඕලන්දය |

I හා II තීරු ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

(i) BACD (ii) CDEA (iii) EBAD (iv) DBAE

★ පහත සඳහන් A,B,C,D, තොරතුරු ඇසුරෙන් 26 සිට 27 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - විලියම් ෂේක්ස්පියර්

B - ජෝන් කැල්වින්

C - බොට්ටිචෙල්ලි

D - ජොහැන්නස් කෙප්ලර්

(26) විද්‍යාත්මක ක්ෂේත්‍රයේ පුනරුදයක් ඇති කිරීමට දායක වූ පුද්ගලයා,

(i) A (ii) B (iii) C (iv) D

(27) පුනරුද සමයේ යුරෝපයේ ඇති වූ ආගමික ප්‍රතිසංස්කරණයට අදාළ අයකු සඳහන් අක්ෂරය වන්නේ,

(i) A (ii) B (iii) C (iv) D

(28) උඩරට රජවරු ලන්දේසින් සමඟ අත්සන් කළ ගිවිසුම් දෙක ඇතුළත් වගන්ති කිහිපයක් පහත දක්වේ.

A - පෘතුගීසීන් පළවා හැරීමට ලන්දේසින් රජුට උදවු කිරීම.

B - මුහුදු බඩ ගව්වක් පමණ තීරුවක් ලන්දේසින්ට පැවරීම.

C - කොළඹ, ගාල්ල, මාතර හා යාපනය දිශාවන් ලන්දේසින්ට පැවරීම.

D - යුධ වියදම් රජු විසින් දැරීම.

ක්‍රි. ව. 1766 ගිවිසුමේ කොන්දේසි වන්නේ,

(i) A හා B ය. (ii) A හා D ය. (iii) B හා C ය. (iv) C හා D ය.

පහත ප්‍රකාශ ඇසුරෙන් 29 සිට 31 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

A - කාර්මික විප්ලවය

මහා බ්‍රිතාන්‍ය

B - දුවන නඩාව

රෙදි වීවීම.

C - ආරක්ෂක ලාම්පුව

ප්‍රවාහන ක්ෂේත්‍රය

D - පරිසරය

කාර්මික විප්ලවය

(29) දෙවැන්න තුළ පළමුවැන්නේ වර්ධනය පෙන්වන යුගලය වන්නේ,

(i) A (ii) B (iii) C (iv) D

(30) පළමුවැන්න හා දෙවැන්න අතර කිසිදු සබඳතාවක් නැති යුගලය වනුයේ,

(i) A (ii) B (iii) C (iv) D

(31) දෙවැන්න පළමුවැන්නේ විනාශයට හේතු වූ බව පෙන්වන යුගලය කුමක්ද?

(i) A (ii) B (iii) C (iv) D

(32) මහනුවර නීත්‍යානුකූල අයිතිය ඉංග්‍රීසීන්ට ලැබුනේ,

(i) රොබට් බ්‍රවුන්රිග් සමයේ ය. (ii) තෝමස් මේට්ලන්ඩ් සමයේය.

(iii) ෆෙඩ්රික් නෝර්ත් සමයේය. (iv) හෙන්රි මැකලම් සමයේ ය.

(33) පිළිමතලව්වේ අධිකාරම් විසින් මුත්තුසාමි කුමරු වෙනුවට රජකමට පත්කළ කන්නසාමි කුමරු රජ බවට පත්වුයේ,

(i) ශ්‍රී විජය රාජසිංහ නමිනි. (ii) ශ්‍රී වික්‍රම රාජසිංහ නමිනි.

(iii) කීර්ති ශ්‍රී රාජසිංහ නමිනි. (iv) රාජාධිරාජසිංහ නමිනි.

(34) ලංකාවේ ඓතිහාසික සිදුවීම් කිහිපයක් පහත වේ.

A - 1797 මුහුදුබඩ කැරැල්ල

B - 1803 උඩරට ආක්‍රමණ

C - සියමින් උපසම්පදා භික්ෂූන් උඩරටට වැඩම කරවීමට නාවික සහය දීම.

D - ජූරි සභා ක්‍රමය හඳුන්වා දීම.

ඉංග්‍රීසි පාලන සමයට පමණක් අයත් සිදුවීම් ඇතුළත් පිළිතුර තෝරන්න.

(i) ABC (ii) ABD (iii) ACD (iv) BCD

(35) ශ්‍රී ලංකාවට ප්‍රථමවරට ව්‍යවස්ථාදායක සභාව හඳුන්වා දුන් ප්‍රතිසංස්කරණය වන්නේ,

(i) මැනිං (ii) කෲව් මැකලම් (iii) ඩොනමෝර් (iv) කෝල්බෲක්

(36) සීමිත ජන්ද බලය හඳුන්වාදුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය වන්නේ,

(i) කෝල්බෲක් (ii) මැනිං (iii) කෲ - මැකලම් (iv) මැනිං ඩෙවොන්ෂයර්

(37) 1848ට පෙර ජනතාව පීඩාවට පත්කළ සුනඛ බද්ද වැනි අසාධාරණ බදු සමූහයක් පැනවුයේ,

(i) ෆන් එංගල් බෙක් ය. (ii) ටොරිංටන් ය.

(iii) විලියම් ග්‍රෙගරිය (iv) ෆෙඩ්රික් නෝත් ය.

(38) විධායක කාරක සභා 7 හඳුන්වාදුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය වන්නේ,

(i) සෝල්බරි (ii) මැනිං (iii) ඩොනමෝර් (iv) කෲ මැකලම්

(39) සෝල්බරි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට අනුව එංගලන්ත කිරීටය නියෝජනය කළේ,

(i) අගමැති විසිනි (ii) සෙනට්සභාව විසිනි.

(iii) තානාපති විසිනි (iv) අග්‍රාණ්ඩුකාරයා විසිනි.

(40) ශ්‍රී ලංකාව ස්වාධීන ස්වෛරී ජනරජයක් බවට පත්වුයේ,

(i) ක්‍රි.ව 1948 (ii) ක්‍රි.ව 1972 (iii) ක්‍රි.ව 1931 (iv) ක්‍රි.ව 1978

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

දෙවන වාර පරීක්ෂණය 2017
மூன்றாம் தவணைப் பரீட்சை 2017
**Second Term Test 2017**

11 ශ්‍රේණිය
தரம்11
**Grade 11**

ඉතිහාසය **II**
History **II**

පැය 3 යි
Three hours

**සැලකිය යුතුය.**

- ⋆ I කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- ⋆ II කොටසෙන් ප්‍රශ්න හතරකට ද III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.
- ⋆ පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන 06කි.

## I කොටස

(01) (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලංකා සිතියමේ ද, (ii) යටතේ දක්වා ඇති ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියමේද ලකුණු කර නම් කරන්න.

(i) සීගිරිය, අනුරාධපුරය, මහනුවර, වලවේ ගඟ, මල්වතු ඔය, පොළොන්නරුව, ජම්බුකොළ පට්ටන, ගෝකණ්ණ, මාගම, බලංගොඩ , බටදොඹලෙන, කෝට්ටේ.

(ii) එංගලන්තය, රතුමුහුද, පර්සියානු බොක්ක, සුභ පැතීමේ තුඩුව, ජපානය, කොන්ස්තන්තිනෝපලය.
(ලකුණු 18)

(ආ) පහත ABC හා D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයන් හා ස්ථාන අනුපිළිවෙලින් ලියන්න.

(i) (A) - කපු කෙටීම සඳහා ජෙනී යන්ත්‍රය නිපද වූ තැනැත්තා

(B) - විජය ඇතුළු පිරිස මෙරටට ගොඩබට ස්ථානය

(C) - ෆෙඩ්රික් නෝර්ත් උඩරට රජු සමඟ සාකච්ඡාවට යැවූ ඉංග්‍රීසි සෙන්පතියා

(D) - ඉන්දියාවට පැමිණි ප්‍රථම පෘතුගීසි ජාතිකයා. (ලකුණු 04)

A හා B හා D යටතේ දක්වා ඇති පිංතූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(ii) (i) ‘A’ වලින් දක්වා ඇත්තේ කුමක්ද?,

(ii) මෙහි සිට පාලනය ගෙන ගිය පාලකයා කවරෙක්ද?

(iii) මෙය පිහිටා ඇති දිස්ත්‍රික්කය කුමක්ද?

(iv) මෙම ස්ථානය නැරඹූ අය තම අදහස් සටහන් කර ඇති ප්‍රාකාරය නම් කරන්න. (ලකුණු 04)



(iii) (i) B වලින් දැක්වන පුද්ගලයාගේ නම කුමක්ද?

(ii) මෙතුමා කුමන ජාතිකයෙක්ද?

(iii) මෙතුමාගේ මූලිකත්වයෙන් වර්ෂ 1880 දී පිහිට වූ සංවිධානය කුමක්ද?

(iv) මෙතුමාගේ මූලිකත්වයෙන් කොළඹ පිහිටුවන ලද පාසල කුමක්ද? (ලකුණු 04)

## II කොටස

(02) (i) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය පිළිබඳ සාධක හමු වූ ලෙන් තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) පූර්ව ඓතිහාසික යුගය ප්‍රාග් ඓතිහාසික යුගයෙන් වෙන්කර ගැනීමට පදනම් වූ සාධක දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) පූර්ව ඓතිහාසික යුගයේ දියුණු තාක්ෂණයක් පැවති බව කරුණු දෙකක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) මුල් ඓතිහාසික යුගයේ ජනාවාසවල ව්‍යාප්තියට බලපෑ සාධක කරුණු තුනක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 06)

(03) (i) ශ්‍රී ලංකාවේ පැරණි සමාජයේ සෞඛ්‍ය පහසුකම් නගා සිටුවීම සඳහා කටයුතු කළ පාලකයන් තිදෙනෙක් නම් කරන්න. (ලකුණු 03)

(ii) හේන් වගාකිරීම වෙනුවෙන් පැරණි රජවරු අය කළ බදු වර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 04)

(iii) ශ්‍රී ලංකාවේ පැරණි සමාජයේ දේශීය හා විදේශීය වෙළෙඳාම පැවති බව කරුණු දෙකක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) අන්‍ය සංස්කෘතින්ට අයත් ජන කණ්ඩායම් සමග සුහදශීලීව ජීවත් වීම මෙරට ඉතිහාසය තුළ කැපී පෙනෙන ලක්ෂණයක් බව උදාහරණ තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(04) (i) පහත සඳහන් එක් එක් කාර්යය සඳහා පැරණි ලංකාවේ ක්‍රියාත්මක වූ බදු වර්ගය කුමක් ද යන්න ලියා දක්වන්න.

A - රජුට අයත් ඉඩම්වල වගා කිරීම වෙනුවෙන් ගෙවන ලද බද්ද

B - ඇළ මාර්ගවල මත්ස්‍යයින් ඇල්ලීම වෙනුවෙන් රජය අයකළ බද්ද

C - වැව්වල ජලය වගා කටයුතු සඳහා භාවිතා කරන්නන්ගෙන් අයකළ බද්ද (ලකුණු 03)

(ii) හෝපිටිගමුව වෙළෙඳපොලේ පාලන කටයුතු සම්බන්ධයෙන් පනවා තිබූ වැදගත් නීති දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) පැරණි ශ්‍රී ලංකාවේ පැවති කර්මාන්ත දෙකක් පිළිබඳ නිදසුන් දෙකක් පහිතව පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) පැරැන්නන්ගේ ආහාර වර්ගවල විවිධත්වයක් පැවති බව ඔවුන් භාවිතා කළ ආහාර ඇසුරෙන් නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(05) (i) පහත සඳහන් වැව් කරවන ලද රජවරුන් කවුරුන්දැයි අනුපිළිවෙලින් දක්වන්න.

A - අභය වැව

B - තිසා වැව

C - කලා වැව (ලකුණු 03)

(ii) අතීතයේදී දිග මැනීම සඳහා භාවිතා කළ මිම් දෙකක් සහ අවකාශය මැනීමට භාවිතා කළ මිම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) අපේ පැරැන්නන් පරිසරය ආරක්ෂා කළ ආකාරය උදාහරණ 2ක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) පැරණි වාරි තාක්ෂණයේ විශිෂ්ටත්වය වැව් හා ඇළ මාර්ග තැනවීම ඇසුරෙන් උදාහරණ තුනක් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 06)

(06) (i) ශ්‍රී ලංකාවේ පළමු වන නාගරිකරණ යුගයට අයත් පාලන මධ්‍යස්ථාන දෙකක් ද, දෙවන නාගරිකරණ යුගයට අයත් පාලන මධ්‍යස්ථාන එකක් ද නම් කරන්න. (ලකුණු 03)

(ii) පළමුවන නාගරිකරණ යුගයට අයත් අවසන් පාලන මධ්‍යස්ථානය බිඳ වැටීමට හේතු වූ කරුණු දෙකක් ලියා දක්වන්න. (ලකුණු 04)

(iii) ශ්‍රී ලංකාවේ දෙවන නාගරිකරණ මධ්‍යස්ථාන වශයෙන් තෙත් කලාපීය ස්ථානයන් තෝරා ගැනීමට පදනම් වූ කරුණු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) දෙවන පරාක්‍රමබාහු රජතුමාගේ දේශපාලන හා සාහිත්‍ය සේවාවන් තුනක් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(07) (i) පහත සඳහන් දේශපාලන සංසිද්ධි හා බැඳුණු රාජධානි පිළිවෙලින් නම් කරන්න.

A - ''ආර්ය චක්‍රවර්ති'' නම් ඇමතිවරයා දළඳා වහන්සේ රැගෙන යාම.

B - ''සිංහල සංගය'' නම් කැරැල්ල.

C - කැලිකට් හි සැමොරින්ගෙන් උදව් ලබා ගැනීම. (ලකුණු 03)

(ii) පහත A,B,C හා D වලින් දක්වෙන සිංහල හා පෘතුගීසි ජාතිකයන් අතර ඇති වූ සටන් කිහිපයක් නායකයින් ය. එම සටන් ඇති වූ ස්ථාන පිළිවෙලින් නම් කරන්න.

A - ටිකිරි කුමාරු හා පෙරෙයිරා අපොන්සු ද ලසර්දා

B - පළමුවන විමලධර්මසූරිය රජු හා පේරෝ ලෝපේස් ද සූසා

C - පළමුවන විමලධර්මසූරිය රජු හා දොන් ජෙරනිමෝද අසවේදූ

D - දෙවන රාජසිංහ රජු හා දියෝගෝ ද මේලෝ ක්‍රැස්තෝ (ලකුණු 04)

(iii) ලන්දේසීන් තම වෙළෙඳ බලය තහවුරු කර ගැනීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) ශ්‍රී ලංකාවට පැමිණි යුරෝපා ජාතීන්ට ක්‍රි.ව. 1815 වන තෙක් ම උඩරට රාජ්‍යය යටත් කර ගැනීමට නොහැකි වූ හේතු තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

## III කොටස

(08) (i) පහත දක්වන පුද්ගලයින් , පුනරුද සමයේ කුමන ක්ෂේත්‍රවල දියුණුව සඳහා කටයුතු කළේද?

A - රෆායල් සැන්ඩි

B - විලියම් හාවේ

C - විලියම් ෂේක්ස්පියර් (ලකුණු 03)

(ii) පුනරුද සමයේ සිදු වූ ආගමික ප්‍රතිසංස්කරණවල ප්‍රතිඵල දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) ''කුරුස යුද්ධය'' යුරෝපා වෙළෙඳාමට නව ආලෝකයක් වූ බව නිදසුන් දෙකක් යටතේ පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) 'පුනරුදය' ලංකාව කෙරෙහි බලපෑ ආකාරය දේශපාලන ආර්ථික සමාජ සංස්කෘතික ක්ෂේත්‍රය ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(09) 17 වන සියවසේ දී කාර්මික විප්ලවය ආරම්භ විය.

(i) බ්‍රිතාන්‍යයට අමතරව කාර්මික විප්ලවය ව්‍යාප්ත වූ යුරෝපා රටවල් තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) කාර්මික විප්ලවය වෙනත් රටවල් කරා ව්‍යාප්ත වීමට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) කාර්මික විප්ලවය සමාජ ක්ෂේත්‍රයට ඇති කළ බලපෑම කරුණු දෙකක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) ''කාර්මික විප්ලවය නොනවතින ක්‍රියාවලියකි'' සන්නිවේදන, ප්‍රවාහන හා කෘෂිකාර්මික ක්ෂේත්‍ර ඇසුරෙන් උදාහරණ තුන බැගින් දක්වා පැහැදිලි කරන්න. (ලකුණු 06)

දෙවනු වාර පරීක්ෂණය

ඉතිහාසය I 11 ශ්‍රේණිය

<u>පිළිතුරු පත්‍රය</u>

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (01) | 3 | (11) | 1 | (21) | 1 | (31) | 4 |
| (02) | 3 | (12) | 3 | (22) | 4 | (32) | 1 |
| (03) | 3 | (13) | 2 | (23) | 1 | (33) | 2 |
| (04) | 4 | (14) | 3 | (24) | 3 | (34) | 3 |
| (05) | 2 | (15) | 3 | (25) | 3 | (35) | 4 |
| (06) | 4 | (16) | 4 | (26) | 3 4 | (36) | 3 |
| (07) | 1 | (17) | 2 | (27) | 4 | (37) | 2 |
| (08) | 3 | (18) | 2 | (28) | 3 | (38) | 3 |
| (09) | 2 | (19) | 3 | (29) | 1 | (39) | 4 |
| (10) | 3 | (20) | 1 | (30) | 3 | (40) | 2 |

## II කොටස

(01) (අ) (i) A ජේම්ස් හාගියුස්
B තම්මැන්නාව
C මැක්ඩෝල්
D වස්කෝදගාමා

(ii) (i) සීගිරි චිත්‍රයක් / සීගිරි ලලනාවක්

(ii) I වන කාශ්‍යපරජු

(iii) මාතලේ

(iv) කැටපත්පවුර

(iii) (i) හෙන්රි ස්ටීල් ඔල්කට්තුමා

(ii) ඇමරිකානු

(iii) පරම විඥනාර්ථ බෞද්ධ සමාගම

(iv) ආනන්ද විද්‍යාලය

(02) (i) කුරුවිට බටදොඹලෙන , පාහියන්ලෙන, කිතුල්ගල බෙලිලෙන, අත්තනගොඩ අළුලෙන.

(ii) ලෝහ භාවිතය
ස්ථිර නිවාස
ක්‍රමවත් සුසාන ක්‍රම

(iii) මැටි භාණ්ඩ තාක්ෂණය
නිවාස ඉදිකිරීම
යකඩ භාවිතය
පබළු නිපදවීමේ තාක්ෂණය

(iv) භූ භෞතික පිහිටීම, වාර්ෂික වර්ෂාපතන අගය, පසේ ස්වභාවය, භූවිෂමතාව, ස්වභාවික සම්පත්වල ව්‍යාප්තිය, ජලවහනය.

(03) (i) බුද්ධ දාසරජතුමා , vවන මහින්ද රජතුමා , හතරවන කාශ්‍යප රජතුමා , I වන උපතිස්ස රජතුමා

(ii) කෙටු කනබ, කැති අඩ

(iii) නානාදේශි, වලඤ්ඤියාර්, අයින්නුරුවර් , වෙළඳ සංවිධාන, කාමබෝජ වෙළෙන්දන්.

(iv) දෙමළ, ග්‍රීක, මැසිඩොනියන් වෙළඳුන් මෙරට වෙළඳමේ සඳහා පැමිණ තිබීම.

දෙමළ අධිකාරිනම් නිලධාරියෙකු රාජ සභාවේ සිටීම.

අම්පාර සෙල්ලිපියක සිංහල කාන්තාවක් දෙමල පුරුෂයෙකු සමඟ විවාහ වීම පිළිබඳ සඳහන් විම.

බලය ලබාගැනීම සඳහා අගම්පඩි සේනා පැමිණීම.

පළවන විජයබා රජුගේ කාලයේදී වේලයිකාර හමුදා පැමිණීම.

(04) (i) A බොජකපති
B මතරමජිබක
C දකපති

(ii) වෙළඳපල හරහා යන්නවුන්ගෙන් බදු අය නොකළයුතුය.

නිලධාරින්ට නොපෙන්වා භාණ්ඩ විකුණන අයගෙන් දෙගුණයක් බදු අයළ යුතුබව

ප්‍රමිතිගත නොකරන ලද තරාදිපඩි යොදා වෙළඳාම් නොකළ යුතුබව

බුලත් පුවක් මැස්සක තබා විකිණිය යුතුබව

ආදි පිළිතුරු සඳහා ......

(iii) කුඹල් කර්මාන්තය , කම්හල් කර්මාන්තය, මැණික් කර්මාන්තය, පේෂ කර්මාන්තය

(iv) උඳු , මුං, තල, මෑ, අමු, මෙනෙරි

සුවඳ ගිතෙලින් පිසූ මොණර මස්

කාඩි ඇඹුල

කැඳ වර්ග, අත්සුනු

කුළුබඩු ආහාර රස කර ගැනීම සඳහා යොදා ගැනීම.

කුඩා මාළු වර්ග ආහාරයට ගැනීම.

(05) (i) A පණ්ඩුකාභය
B දෙවන පෑතිස්
C දාතුසේන

(ii) වියත රියන
ලාහ , පැල, කුරුනි , අමුණු, කරිහිස

(iii) අනුරාධපුර පුවරු ලිපිය, බුද්ධන්නේ හෙල සෙල්ලිපිය, කොන්ඩුවට්ටුවාන් සෙල්ලිපිය ආදිය ....

(iv) ඇලහැර ඇළ, යෝධ ඇළ, මිනිපේ ඇළ,
වැවක කොටස් ඇසුරින් .....

(06) (i) අනුරාධපුර , මාගම, පොළොන්නරුව /

දඹදෙණිය යාපහුව , කුරුණෑගල, ගම්පල , කෝට්ටේ

(ii) දුර්වල පාලකයන් බලයට පත්වීම.

ආර්ථිකය බිඳවැටීම.

කාලිංග මාග ආක්‍රමණය.

(iii) ස්වභාවික ආරක්ෂාව ,

අහස්දියෙන් වී වගාකල හැකිවීම.

කුළුබඩු වෙළඳාමේ දියුණුව

වරායන් ආශ්‍රිත වෙළඳාම දියුණුවීම.

(iv) චන්ද්‍රබාහු ආක්‍රමණය I සහ II පරාජය කිරීම.
කාලිංග මාඝ පරාජය කිරීම.

කව්සිළුමිණ , විසුද්ධි මාර්ග සන්නය , දඹදෙණි කතිකාවත

(07) (i) A දඹදෙණිය
B කෝට්ටේ
C කෝට්ටේ

(ii) A මුල්ලේරිය,
B දන්තුරේ
C බලන
D ගන්නෝරුව

(iii) රජු සමඟ සහයෝගයෙන් සිටීම.

අවශ්‍ය අවස්ථාවලදී යුධමය ක්‍රියාමාර්ග ගැනීම.

රජු සමඟ ගිවිසුම් වලට එළඹීම.

(iv) ස්වභාවික ආරක්‍ෂාව

රාජපක්ෂික භාවය

ගරිල්ලා සටන් ක්‍රම

රජවරුන්ගේ රාණශූරත්වය

(08) (i) A චිත්‍ර කලාව
B වෛද්‍ය විද්‍යාව
C නාට්‍ය කලාව

(ii) පල්ලියේ ආධිපත්‍ය විවේචනය කිරීම.

රෙපරමාදු ආගම බිහිවීම.

(iii) නව මුහුදු මාර්ග සොයාගැනීම.
ලෝකය ගෝලාකාර බව සොයාගැනීම.
යුරෝපා ජාතීන් පෙරදිගට පැමිණීම.
මුදල් භාවිතය ප්‍රචලිතවීම.
බැංකු කටයුතු දියුණුවීම.

(iv) දේශපාලන

ලංකාවේ රාජාණ්ඩුව බිඳවැටීම.

පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක් ලැබීම.

දේශපාලන පක්‍ෂ ක්‍රමයක් ලැබීම.

රෝම ලන්දේසි නීතිය ලැබීම.

ආර්ථික

කුළුබඩු වෙළඳාමේ දියුණුව

වතුවගාවේ ආරම්භය

වාණිජ ආර්ථික රටාවකට හුරුවීම.

ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමය බිඳ වැටීම.

යටිතල පහසුකම් බිඳවැටීම.

සමාජ සංස්කෘතික

ඉංග්‍රිසි අධ්‍යාපනය පුළුල්වීම.

නව රැකියා අවස්ථා ලැබීම.

කතෝලික හා රෙපරමාදු ආගම් මෙරට තුල ස්ථාපිත වීම.

යුරෝපීය වාස්තු විද්‍යාත්මක ලක්‍ෂණ මෙරට ගොඩනැගිලි ඉදිකිරීමේ කලාව සඳහා යොදාගැනීම.

(09) (i) ප්‍රංශය , ස්පාඤ්ඤය, ජර්මනිය,

(ii) ජනගහනය සීඝ්‍රයෙන් වර්ධනයවීම.

යුරෝපය තුල ප්‍රවාහනය සහ ගමනාගමනයේ වර්ධනය

ප්‍රංශය සහ ජර්මනිය ගල්අගුරු සොයාගැනීම.

(iii) විශාල නගර බිහිවීම. ඒවා ජනාකීර්ණවීම.

පන්ති සහිත සමාජයක් බිහිවීම.

නව වෘත්තීන් බිහිවීම.

මුඩුක්කු නිවාස බිහිවීම.

සනීපාරක්ෂාව අවම වීම.


සමාජ අපචාරී ක්‍රියා ඇතිවීම.

කම්කරු උද්සෝෂණ ඇතිවීම.

නිර්ධන පන්තියේ සමාජ ගැටළු සඳහා රජයයන් මැදිහත්වීම.


(iv) සන්නිවේදන, ප්‍රවාහන, කෘෂිකාර්මික ක්ෂේත්‍රයන්ට අදාල පිළිතුරු වලට ලකුණු ලබාදීම.

**(01) (අ)** i.




N
ජම්බුගෝලපට්ටන
මල්වතුඔය
ගෝකණ්ණ
අනුරාධපුරය
කලා ඔය
සීගිරිය
පොළොන්නරුව
මහනුවර
කෝට්ටේ
බලන්ගොඩ
බටදොඹලෙන
වලවේ ගඟ
මාගම

**(01) (ආ)** ii.



SABARAGAMUWA PROVINCIAL EDUCATION DEPARTMENT
N
ජපානය
පර්සියන් බොක්ක
රතු මුහුද

(01) (අ) i.



**(01) (ඇ)** ii.

